130512

OL/2010/43-S-I

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**43 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர(சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2010**

| | |
|---|---|
| චිත්‍ර I | පැය එකයි |
| சித்திரம் I | ஒரு மணித்தியாலம் |
| Art I | One hour |

| | |
|---|---|
| I | |
| II | |
| III | |
| එකතුව | |

සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

විභාග අංකය :......................................

- පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක **01** සිට **05** තෙක් ප්‍රශ්නවලට **නිවැරදි** පිළිතුරු සපයන්න.



**1.** නූතන විහාර සිතුවම් අතර විශේෂයක් ගන්නා .................................................... විහාරයේ සිතුවම් අතුරෙන් උපුටාගන්නා ලද සිතුවම් කොටසකි.

**2.** ජාත්‍යන්තර කීර්තියට පත් .................................................... සිත්තරාණන් විසින් අඳින ලද මෙම සිතුවම් ඔහුට ම ආවේණික ශෛලියකින් ඇඳ ඇත.

**3.** මෙම සිතුවම් කොටසින් සිදුහත් කුමරු .................................................... සැරසෙන අයුරු නිරූපණය කෙරෙයි.

**4.** අඛණ්ඩ බාහිර සෘජු හා වක්‍ර රේඛා අතරට තැනින් තැන යොදන ලද .................................................... රේඛා ශිල්පියාගේ අනන්‍යතාව නිරූපණය කරයි.

**5.** මහාමායා දේවියගේ සිහිනයේ සිට .................................................... දක්වා චිත්‍රාවලියක් සේ ඇඳ ඇති මෙම සිතුවම් සඳහා දීප්තිමත් වර්ණ භාවිත කොට ඇත.

[ දෙවැනි පිටුව බලන්න.

- අංක 6 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට **නිවැරදි** පිළිතුරු සපයන්න.

6. මහනුවර දළදා මැඳුර හා සම්බන්ධ පත්තිරිප්පුව නිර්මාණය කළ ශිල්පියා කවු ද?

.......................................................................

7. "සිරිබිරිය්" නම් වූ සුප්‍රකට කාටුන් චිත්‍ර කාගේ නිර්මාණයක් ද?

.......................................................................

8. තාත්ත්වික නිරූපණයෙන් බැහැරව ශෛලිගත අයුරින් නෙළා ඇති ඉන්දුනිමින ශිෂ්ටාචාරයෙන් හමු වූ මූර්තිය කුමක් ද?

.......................................................................

9. ස්වර්ගය, මනුලොව, නිරය නිරූපණය කෙරෙන සිය්ටයින් දෙව් මැඳුරේ දක්නට ඇති සුවිසල් ප්‍රෙස්කෝ සිතුවම කුමන නමකින් හැඳින්වේ ද?

.......................................................................

10. ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයක් සේ සැලකෙන ස්ථානයක් හා සම්බන්ධ චිත්‍ර සමූහයක් නොබෝද දුර්වර්ණ වූ බවට පුවතක් පළවිය. ඒ කොහි ද?

.......................................................................

- අංක 11 සිට 15 තෙක් දී ඇති ප්‍රශ්නවලට වඩාත් **නිවැරදි** පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. ගම්පොල යුගයේ නිර්මාණයක් වන ඇම්බැක්කේ දේවාලයේ කැටයම්
   (1) සම්මත හා කල්පිත සැරසිලි ඇසුරෙන් නිර්මිත අල්පෝන්නත කැටයම් වේ.
   (2) සම්මත සැරසිලි, කල්පිත රූ හා මානව රූ අල්පෝන්නතව නෙළා ඇත.
   (3) ස්වභාවික හා කල්පිත රූ සටහන් අල්පෝන්නතව නෙළා ඇත.
   (4) පුෂ්පලතා හා සත්ත්ව මෝස්තර ගැඹුරට හාරා ඇත.

12. පොළොන්නරුවේ තිවංක පිළිමගෙය තුළ
   (1) දක්නට ඇති සිතුවම් ශෛලිය පොළොන්නරුවේ වෙනත් ස්ථානයක දක්නට නොමැත.
   (2) දක්නට ඇති සිතුවම් ශෛලියේ ආභාසය ඉන්පසු යුගවලට බලපා ඇත.
   (3) මහනුවර යුගයේ සිතුවම් සම්ප්‍රදායට සමීපකම් දක්වන චිත්‍ර රැසක් හමුවේ.
   (4) පොළොන්නරු යුගයේ හා ඉන් පසු කලෙක බිහිවූ චිත්‍ර කලා ආරක ලක්ෂණ දක්නට ලැබේ.

13. නටරාජා පිළිරුවේ සංකේත අතුරෙන් අවිද්‍යාව සංකේතවත් කිරීම සඳහා යොදාගෙන ඇත්තේ
   (1) උඩැක්කියයි.
   (2) ගිනිසිළුවයි.
   (3) වාමනරුවයි.
   (4) ගජහස්ත මුද්‍රාවයි.

14. ඒ.සී.ජී.එස්. අමරසේකර
   (1) ආගමික තේමා ඇසුරෙන් විශාල චිත්‍ර ප්‍රමාණයක් නිර්මාණය කළ ශිල්පියෙකි.
   (2) ශාස්ත්‍රාලීය සිද්ධාන්ත අනුගමනය කරමින් යථාර්ථවාදීව සිත්තම් කළ ශිල්පියෙකි.
   (3) කල්පිත නිරූපණය හා භාවරූපී ශිල්ප ක්‍රම අගය කළ චිත්‍ර ශිල්පියකි.
   (4) තෙල්සායම් මාධ්‍යයෙන් ආලේඛ්‍ය චිත්‍ර පමණක් නිර්මාණය කළ ශිල්පියෙකි.

15. මීවම්හි පාත්තයෝ නැමති සුප්‍රසිද්ධ පැරණි සිතුවම
   (1) සොහොන් ගෙයක බිත්තියක ඇඳ ඇති පක්ෂි රූ ඇසුරෙන් කළ සිතුවමකි.
   (2) මිසර දේවස්ථානයක දොර පනේලයක ඇඳ ඇති පක්ෂි රූ සමූහයකි.
   (3) කැටයම් කරන ලද පක්ෂි රූප වර්ණාලේප කොට නිම කරන ලද්දකි.
   (4) පක්ෂීන් සිවු දෙනෙකු එක් දිසාවකට ගමන් කරන අයුරු දක්වෙන සිතුවමකි.

[ තුන්වැනි පිටුව බලන්න.

- අංක **16** සිට **20** තෙක් දී ඇති රූපවලට වඩාත් සාජු සබඳතාවක් දක්වන රූප සටහන ඒ ඉදිරියෙන් ඇති **1, 2, 3, 4** යන රූප අතුරෙන් තෝරා **හිස් ඉරි මත අංකය** යොදන්න.

**16.**  (.........) 

(1) (2) (3) (4)

**17.**  (.........) 

(1) (2) (3) (4)

**18.**  (.........) 

(1) (2) (3) (4)

**19.**  (.........) 

(1) (2) (3) (4)

**20.**  (.........) 

(1) (2) (3) (4)

- අංක **21** සිට **25** තෙක් ප්‍රශ්නවල දී ඇති වැකිවල හිස්තැනට සුදුසු වචනය යොද හිස් තැන් පුරවන්න.

**21.** අවිග්නෝන්හි යුවතියෝ ................................................................ ශිල්පියාගේ සහරූපි කලා ආර ඇරඹු චිත්‍රය ලෙස සැලකේ.

**22.** "ගෝලය, කේතුව, සිලින්ඩරය තුළින් සියලු දේ නිර්මාණය වී ඇතැ"යි යන ඝණිකවාදී සංකල්පය ප්‍රකාශ කරන ලද්දේ

................................................................ විසිනි.

**23.** ඇම්. සාර්ලිස් ශිල්පියා විහාර සිතුවම් කලාවට මෙන්ම බෞද්ධ ................................................................ සිතුවම්වලට ද මහත් ප්‍රසිද්ධියක් ඉසිලීය.

**24.** ගම්පොල යුගයේ ලංකාතිලක විහාරය සැලසුම් කර නිර්මාණය කරන ලද වාස්තුවිද්‍යා නිර්මාණශිල්පියා වනුයේ

................................................................ නම් වූ ඉන්දීය ශිල්පියෙකි.

**25.** පොළොන්නරුවේ දළද මලුව යයි සැලකෙන භූමියේ නිශ්ශංකමල්ල රජු විසින් ඉදිකරන ලද චෑත්‍යාකාර ගොඩනැගිල්ල

................................................................ නමින් හැඳින්වේ.

[ හතරවැනි පිටුව බලන්න.

130512



● ප්‍රශ්න අංක **26** සිට **30** තෙක් දී ඇති ප්‍රශ්නවලට **A, B, C, D, E** යන රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.



**A**



**B**



**C**



**D**



**E**

**26.** **A** - කටුනායක ගුවන් තොටුපලේ දක්නට ඇති මෙම සිතුවම කාගේ නිර්මාණයක් ද? ..............................

**27.** **B** - ජෝර්ජ් කීට් ශිල්පියා විසින් නිර්මාණය කරන ලද මෙම සිතුවම කිනම් නමකින් හැඳින්වේ ද? ..............................

**28.** **C** - ඩේවිඩ් පේන්ටර් ශිල්පියා විසින් අඳිනු ලැබූ මෙම සිතුවම කිනම් නමකින් හැඳින්වේ ද? ..............................

**29** **D** - ගල් බිත්තියක ඇඳ ඇති මෙම සිතුවම දක්නට ඇත්තේ කිනම් ස්ථානයක ද? ..............................

**30.** **E** - මෙම සිතුවම නිර්මාණය කළ ඉතාලි ජාතික ශිල්පියා කවුද? ..............................

● අංක **31** සිට **35** තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.

**31.** ගෝපුර ..............................

**32.** මිනාර් ..............................

**33.** පර්යාලෝකය ..............................

**34.** සංගත වර්ණ ..............................

**35.** ටෙම්පෙරා ..............................

[ පස්වැනි පිටුව බලන්න.

● පහත දැක්වෙන කලා කෘතිය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි පහත සඳහන් උප මාතෘකා අනුව අර්ථවත් වාක්‍ය **පහක්** ලියන්න.



36. තේමාව : ..............................................................................................

..............................................................................................

37. සංරචනය : ..............................................................................................

..............................................................................................

38. වර්ණ හා රේඛාව: ..............................................................................................

..............................................................................................

39. ශෛලිය : ..............................................................................................

..............................................................................................

40. ශිල්පීය කුසලතා : ..............................................................................................

..............................................................................................

* * *

130512

OL/2010/43-S-II

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

Department of Examinations, Sri Lanka

**43 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

| | | |
|---|---|---|
| චිත්‍ර II | | පැය දෙකයි |
| சித்திரம் II | | இரண்டு மணித்தியாலம் |
| Art II | | Two hours |

සැලකිය යුතුයි :

* ඔබේ විභාග අංකය උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති තීරුවේ පැහැදිලි ව ලියන්න.
* උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
* දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් හෝ භාවිත කළ හැකි ය. ("ෆෙල්ට්" පෑන් භාවිතය සුදුසු නැත.)
* සියලු ම ද්‍රව්‍ය ඇස් මට්ටමෙන් පහළ සිටින සේ තැබීමට ශාලාධිපතීන්ට උපදෙස් දී ඇත. එසේ නොතැබූ අවස්ථාවක් වුවහොත්, ඇඳීම පටන් ගැනීමට පෙර, විභාග ශාලාධිපතිට දන්වීමට ඔබට අවසර තිබේ.

## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

※ ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට,

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න.
   මේ සඳහා ඔබට සපයා ඇති රළු කඩදාසිය භාවිත කරන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න.
   මේ සඳහා සපයා ඇති විශේෂ කඩදාසිය භාවිත කරන්න.

※ **මෙම චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.**

※ ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

- **රේඛා අධ්‍යයනය :-**

1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේ දී දක්වන කුසලතා

- **වර්ණ චිත්‍රය :-**

2. ද්‍රව්‍ය සමූහය, තලය මත කලාත්මක ව සම්පිණ්ඩනය වීම
3. පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය
4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගති ලක්ෂණ දක්වීම
5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතාව
6. උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

සැ.යු.

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නො වේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

※※※

130512

**OL/2010/43-S-III**

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**43 | S | III**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

චිත්‍ර III
சித்திரம் III
Art III

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

සැලකිය යුතුයි :

- ඔබ ඇඳිය යුත්තේ **එක චිත්‍රයක්** පමණි.
- ඔබේ **විභාග අංකය** හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති තීරුවේ පැහැදිලි ව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිත කළ හැකි ය. (ෆෙල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)
- ඇඳීමේ සුදු කඩදාසි හා අවශ්‍ය අයට ටිෂූ කඩදාසි සපයනු ලැබේ.

---

'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ **එක් මාතෘකාවක් පමණක් තෝරාගන්න.**

**'අ' කොටස - චිත්‍ර සංරචනය**

1. බෝ සෙවනේ භාවනාවේ යෙදෙන සිල්ගත් උවැසියෝ **නැතහොත්** කෝවිලක / පල්ලියක ආගමික වතාවත්වල යෙදෙන බැතිමතුන්
2. අභය භූමියක් තුළ සතුන් නරඹන පිරිසක්
3. මාළු අස්වනු රැගත් ධීවර බෝට්ටු වෙරළට ඇවිල්ලා
4. සොඳුරු කතාබහක යෙදෙන යෙහෙළියෝ

**'ආ' කොටස - මෝස්තර නිර්මාණය**

5. ළමා කාටූන් චරිතයක් ඇසුරු කරගනිමින්, ළමා ඇඳුම් මැසීමට සුදුසු චිත්ත රෙද්දකට ගැළපෙන ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.
6. ආයත චතුරස්‍රාකාර හැඩයක මේස රෙද්දක් සඳහා සුදුසු මුලුතල මෝස්තරයක් පාරම්පරික සැරසිලි මෝස්තර ඇසුරින් නිර්මාණය කරන්න. පසුබිම් වර්ණය සේ නිල් වර්ණය යොදා ගන්න.
7. චතුරස්‍රාකාර කුෂන් කවරයක් ඇප්ලික් ක්‍රමයට සැරසිලි කිරීම සඳහා ජ්‍යාමිතික හැඩතල ඇසුරෙන් නිර්මාණය කරන්න.

**'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර**

8. "අසිරිමත් හෙට දවසක්" යන තේමාව යටතේ විචිත්‍රවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
9. පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උළෙලට සමගාමීව සකස් කෙරෙන සමරු කලඹක මුල් පිටුවට සුදුසු නිර්මාණයක් කරන්න.
10. කිරිපිටි වර්ගයක් ප්‍රචාරය කිරීම සඳහා වෙළෙඳසල්වල එල්ලා තැබීමට සුදුසු චලනමය ප්‍රචාරක දැන්වීමක් සැලසුම් කරන්න.

❋ ❋ ❋

PAST PAPERS WIKI